(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 437.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 මාර්තු මස 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4399/'13

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික් වන නිලධාරී කොට්ඨාස කාර්යාලය මගින් පාලනය වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පයිනස් සහ වෙනත් වගාවන් වගා කර ඇති බව දන්නේද;

(iii) එලෙස වගා කර ඇති වනාන්තර බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වගා කර ඇති ඉඩම් අනවසරයෙන් පුද්ගලයින් විසින් අල්ලාගෙන ඇති බවත්;

(ii) එම ඉඩම්වලින් කොටසක් රජය මගින් මහජනතාව සඳහා ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (iii) හි සඳහන් වනාන්තර භූමි ප්‍රදේශයෙන් පුද්ගලයින් අනවසරයෙන් පදිංචි වී ඇති ඉඩම් ප්‍රමාණය හා රජය මගින් මහජනතාවට ලබාදී ඇති බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත වනාන්තර භූමි ඉහත පරිදි මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නිසා ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4581/'13

2.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 සහ 2012 වර්ෂවල රාජ්‍ය ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වර්ෂ දෙක වෙනුවෙන් රජය ලබා ගෙන තිබෙන ණය සඳහා ගෙවන ලද පොලී ප්‍රමාණය හා ණය වාරිකය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වර්ෂ වෙනුවෙන් ගෙවන ලද ණය වාරික හා පොලී වාරිකවල එකතුව වාර්ෂික රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4773/'14

3.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රෝහල්වල ඖෂධ හිඟයට පිළියමක් ලෙස ප්‍රාදේශීය වශයෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා අවසර දී තිබේද;

(ii) ඒ සඳහා මිල ගණන් ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම මිල ගණන් වෛද්‍ය සැපයුම් අංශය සමග සංසන්දනය කිරීමට වැඩ පිළිවෙළක් තිබේද;

(iv) පේරාදෙණිය මහ රෝහලේ ඖෂධ මිලදී ගැනීම්වලදී සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5114/'14

4.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ අයවැය යෝජනාවලට ඇතුළත් වූ කාන්තාවන් සඳහා පොලී රහිත ණය ලබා දීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගත හැකි ආකාරය කවරේද;

(iv) ණය ලබා ගැනීම සඳහා කාන්තාවන් විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් කවරේද;

(v) ඒ සඳහා ඇපකරුවන් හෝ ඇපකරයන් අවශ්‍ය වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දැනට එම පොලී රහිත ණය මුදල් ලබා දී ඇති කාන්තාවන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමය මේ වන විට ක්‍රියාත්මක නොවන්නේ නම්, එයට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5192/'14

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලාංකික සහ ඉන්දියානු ධීවරයන්ගේ ගැටලු සම්බන්ධයෙන් මෑතකදී පැවති සාකච්ඡාවල ප්‍රගතිය කවරේද;

(ii) එම ධීවර ගැටලු සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීම කවරේද;

(iii) මේ වන විට ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශයේ රඳවාගෙන සිටින ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් මුදා ගැනීමට රජය විසින් කර ඇති මැදිහත්වීම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයින්ට ලබා දුන් ඉන්ධන සහනාධාරය නවතා තිබේ නම්, ඒ වෙනුවට හඳුන්වා දෙනු ලැබූ විකල්ප පැකේජයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) එම සහනාධාර පැකේජය සහ ඉන්ධන සහනාධාර ක්‍රමය අතර වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4529/'13

6\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හුදකලා පාසල් ළමා මිතුරු පරිසරයකට සංවර්ධන කරන බවටත්;

(ii) එම පාසල්වලට ඇතුළත් කර ගන්නා සෑම දරුවෙකුටම නොමිලේ ධාන්‍ය, බිත්තර සහ කිරි සහිත ආහාර සැපයීමටත්;

(iii) එම පාසල් දරුවන් සඳහා පාවහන් යුගලක් හා වර්ෂය මැදදී අමතර නිල ඇඳුමක් නොමිලේ ලබා දෙන බවටත්;

2013 අයවැයෙන් යෝජනා කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට සංවර්ධනය කර ඇති ළමා මිතුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (අ) (ii) හා (iii) හි සඳහන් යෝජනා මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම යෝජනා ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම යෝජනා ක්‍රියාත්මක නොවන්නේ නම්, ඊට හේතු කවරේද;

(v) එසේ නම්, ඉහත යෝජනා ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4775/'14

7\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ඖෂධ අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙරට සිටින ලියාපදිංචි ඖෂධවේදීන් සංඛ්‍යාව සහ ඖෂධ බෙදාහරින්නන් සංඛ්‍යාව කොපමණද;

(iii) අප රටට අවශ්‍ය ඖෂධවේදීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඖෂධවේදීන් පුහුණු කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5091/'14

8.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ දී ශ්‍රී ලංකා රජය විසින් පලස්තීන රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍ය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබිය දී ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5115/'14

9.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සමස්ත ව්‍යාපාරිකයන් සඳහා එකතු කළ අගය මත බදු ගෙවීමට හා ඒ පිළිබඳව කටයුතු කිරීමට දිවයින පුරා පිහිටුවා ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාල පිහිටා ඇති ස්ථාන එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ආදායම් බදු ගෙවීම හා ඒ සම්බන්ධව කටයුතු කිරීම සඳහා පිහිටුවා ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5424/'14

10.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ පුහුණු ශිල්පී මූලික සේවා ව්‍යවස්ථාවට අනුව, 1997.01.01 දින සිට සියලුම පුහුණු ශිල්පීන් එම සේවාවට අන්තර්ග්‍රහණය කර ඇති බව දන්නේද;

(ii) වෙනත් කිසිදු සේවා ව්‍යවස්ථාවක නොමැති කොන්දේසියක් ලෙස මෙම සේවාවේ කාණ්ඩ සහ උසස්වීම අනුව "අ" කාණ්ඩයේ සිටින ශිල්පීන්ට පළමුවැනි පන්තිය සඳහා උසස්වීම් ලබාදීමේදී 6:1 අනුපාතය අනුගමනය කරනු ලබන්නේද;

(iii) එම අනුපාතය 6/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී වෙනස් කරන බවට අවස්ථා කීපයකදී බලධාරීන් විසින් එකඟ වී ඇති බව දන්නේද;

(iv) නමුත්, මේ වනතුරුත් 6/2006 චක්‍රලේඛය අනුව උසස්වීම් පටිපාටියක් සකස් කිරීමට අපොහොසත්වී තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

(vi) මෙම ගැටලුව නිසා වැටුප් වර්ධක උපරිම සීමාවේ රැඳී සිටින විශාල සේවක පිරිසකට ද අසාධාරණයක් සිදුවන බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4776/'14

11\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රජා සෞඛ්‍ය නගා සිටුවීම සඳහා මෙතෙක් පිහිටුවා ඇති ''සුව දිවි මධ්‍යස්ථාන'' සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් දැනට ක්‍රියාත්මක මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති සුව දිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන එකී මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටුවීමට ඉලක්ක ගත සුව දිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vi) දැනට එම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සුව දිවි මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සුව දිවි මධ්‍යස්ථානවල ප්‍රමාණවත් සායන සංඛ්‍යාවක් පවත්වනු ලබන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4813/'14

12\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී දැනට නිදහස් වෙළඳ කලාපය තුළ වාහන එකලස් කර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගම විසින් අලෙවි කරනු ලබන මෝටර් රථ මාසයක් ඇතුළත ලියාපදිංචි කරන බවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ලිපියක් ගැණුම්කරුවන්ට පෙන්වනු ලබන බවත්;

(ii) එනමුත්, එම සමාගම මගින් විකුණන ලද වාහන ලියාපදිංචි කිරීම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බවත්;

(iii) ඒ හේතුවෙන් එම සමාගමෙන් මෝටර් රථ මිල දී ගෙන ඇති ගැණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් තම වාහන ධාවනය කිරීමට නොහැකිව දැඩි අපහසුතාවයකට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගමෙන් මිලදී ගන්නා ලද වාහන, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර ගැනීම සඳහා පහසුකම් සලසා දෙන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5092/'14

13.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 5 තුළ දී, ශ්‍රී ලංකා රජය විසින් උගන්ඩා රජය වෙත යම් මූල්‍යමය ආධාර කිරීමක් හෝ ව්‍යාපෘති සඳහා ආධාර කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ආධාරවල මූල්‍ය වටිනාකම කොපමණද;

(iii) එම රට වෙත යම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලබා දී තිබේ නම්, එම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබූ ආකාරය කවරේද;

(iv) එම මූල්‍ය ආධාර හෝ ව්‍යාපෘති ආධාර ලබා දීමේ අරමුණ කවරේද;

(v) ශ්‍රී ලංකා රජය විශාල විදේශ ණය ප්‍රමාණයක් ගෙවීමට තිබිය දී, ඉහත පරිදි වෙනත් රටකට ආධාර ලබා දීම නිශ්ඵල ක්‍රියා මාර්ගයක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5117/'14

14.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළ දී ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරයේ විදුලි උත්පාදනය සිදු නොකළ දින ගණන කොපමණද;

(ii) එසේ විදුලිය උත්පාදනය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයේ දී ඉහළ කොත්මලේ ජලාශය හදිසියේම හිස් කිරීමට සිදු වූයේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) එම ජලාශය හිස් කිරීමේදී ජලය පිට කිරීම සිදු කරනු ලැබුවේ විදුලි උත්පාදන යන්ත්‍ර තුළින්ද, නැතහොත්, වෙනත් මාර්ගයකින්ද;

(iv) එසේ කිරීමට හේතු කවරේද;

(v) ඉහත පරිදි ජලය පිට කිරීමට ප්‍රථම ජලාශය තුළ තිබූ ජල මට්ටම කවරේද;

(vi) පිට කළ ජල ප්‍රමාණය ජලාශයේ ජල ධාරිතාවයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පරිදි ඉහළ කොත්මලේ ජලාශය හදිසියේ හිස් කර දැමීමට සිදුවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වූ අලාභය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ එක් සේවකයෙකුට අවම වශයෙන් රු 96,000/- ක හා උපරිම වශයෙන් රු. 265,000/- ක වන්දි මුදලක් ගෙවා 1990.03.31 දින සිට එම ආයතනය වසා දමන බව එවකට පැවති රජයේ විෂය භාර අමාත්‍යවරයා විසින් 1990.03.23 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කළත්, එම සේවකයින්ට ගෙවා ඇත්තේ රු. 50,000/- ක මුදලක් පමණක් බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ඉතා අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවය කළ ඉහත සඳහන් සේවක පිරිසට ඉතිරි වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එවකට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සතුව පැවති නිල නිවාසවල අයිතිය, එම අවස්ථාවේ එහි පදිංචිව සිටි සේවකයින්ට ලබා දෙන බවටත්, නිවාස නොමැති සෙසු සේවකයින්ට ඉඩම් ලබා දෙන බවටත් කළ ප්‍රකාශය අනුව, මේ වන විට සියලුම සේවකයින්ට නිවාස හෝ ඉඩම් ලබා දී අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම නිවාස හෝ ඉඩම් සඳහා මේ වන විට හිමිකම් ඔප්පු ලබා දී අවසන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය,— ජාතික ඖෂධ ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයට ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම සහ එකී ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවලට අදාළ වෙනත් සියලු කරුණු සහ සායනික පරීක්ෂණ පවත්වන ආකාරය නියාමනය කිරීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ජාතික ඖෂධ නියාමන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන නියාමන අධිකාරියක් පිහිටුවීම සඳහා ද; ඖෂධ නියාමන අංශය, වෛද්‍ය උපකරණ නියාමන අංශය, සීමාස්ථ නිෂ්පාදන නියාමන අංශය සහ සායනික පරීක්ෂණ නියාමන අංශය ඇතුළු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අංශ පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික උපදේශක කමිටුවක් පිහිටුවීම සඳහා ද; 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2015 මාර්තු මස 04 වැනි බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2015 මාර්තු මස 04 වැනි බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*3.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— එක්සත් ජාතීන්ගේ පනත යටතේ නියෝග,— 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 11 දිනැති අංක 1892/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා

විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

14.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---